# මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ
# ප්‍රාථමික ශිල්පීය නොවන සේවයේ තනතුරු සඳහා වන ස්ථාන මාරු පරිපාටිය

01. හැඳින්වීම

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික මට්ටමේ ශිල්පීය නොවන සේවයේ තනතුරු සඳහා වන ස්ථාන මාරු සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ යුතු විධිවිධාන නියම කිරීම සඳහා වූ පරිපාටියයි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පරිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ විධිවිධාන වලට අනුකූලව මධ්‍යම පළාත තුළ ස්ථාන මාරු ක්‍රියාත්මක කළ යුතු ය.

සම්බන්ධ වන ආයතන

1.1. දෙපාර්තමේන්තුව :- මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
යොමු අංකය දිනය

1.2. අමාත්‍යාංශය :- මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය
යොමු අංකය: සීපීසී/සීඑම්එස්/1/21/ස්.මාරු.පරි/PL1 දිනය: 2024.04.05

1.3. මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය:-
යොමු අංකය: සීපීසී/සීඑස්/01/04/ස්.මා.ප. දිනය: 2024.05.13

1.4 මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :-
යොමු අංකය: CPC/PSC/29/1/ස්.මා.පරි.PL1 දිනය: 2024.07.16

1.5 මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය:-
යොමු අංකය: දිනය:

02 ක්‍රියාත්මක වන දිනය - මෙම පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමා අනුමත කරන දින සිට ක්‍රියාත්මක වේ.

03 අරමුණ - මධ්‍යම පළාතේ පළාත් සභා පාසල්වල කාර්යයන් ඉටු කිරීම හා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන පොදු මූලික අවශ්‍යතාවන් බාධාවකින් තොරව හා අඛණ්ඩව පවත්වාගෙන යාම පිණිස අවශ්‍ය සහාය ලබාදීම.

04. මෙම ස්ථාන මාරු පරිපාටිය මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවයේ සේවකයන් මධ්‍යම පළාතේ කලාප හා පළාත් පාසල් අතර ස්ථාන මාරු කිරීම සඳහා අදාල වන වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය වේ.

05. මෙම ස්ථාන මාරු පරිපාටියට අනුව මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන ස්ථාන මාරු මණ්ඩලයක් මඟින් වාර්ෂික ස්ථාන මාරු සඳහා කැඳවනු ලබන අයදුම්පත් සහ අනෙකුත් විස්තර සළකා බලා ඉදිරිපත් කරනු ලබන නිර්දේශ මත මධ්‍යම පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කෙරේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024-07-25 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම් (මා. ආ.)

06. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන සේවකයන් පිළිබඳ විස්තර

6.1 ප්‍රාථමික ශිල්පීය නොවන සේවයේ

- පාසල් කාර්ය සහායක
- මුරකරු
- ප්‍රාථමික ශිල්පීය නොවන සේවයට අදාල අනෙකුත් තනතුරු දරන්නන්

6.2 සේවා ස්ථානයක සම්පූර්ණ කළ යුතු සේවා කාලය

රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 2005/1 දරණ චක්‍රලේඛයෙහි පාසල් වර්ගීකරණයට අනුව පහත පරිදි සේවා කාලයන් සම්පූර්ණ කරන ලද සේවකයින් ස්ථානමාරු අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

| | | |
|---|---|---|
| 6.2.1 | අතිදුෂ්කර | - අවම අවුරුදු 03 |
| 6.2.2 | දුෂ්කර | - අවම අවුරුදු 04 |
| 6.2.3 | අපහසු නොවන | - අවම අවුරුදු 05 |
| 6.2.4 | ප්‍රියමනාප/පහසු | - උපරිම අවුරුදු 08 |
| 6.2.5 | ඉතා ප්‍රියමනාප/ වඩාත් පහසු | - උපරිම අවුරුදු 06 |

6.2 (අ) 6.2.1 හා 6.2.2 පරිදි සේවා කාලයන් සම්පූර්ණ කර ඇති සේවකයන් වාර්ෂික ස්ථානමාරුවීම් සඳහා අයදුම්කිරීමට සුදුසුකම් ලබයි.

6.2 (ආ) 6.2.3 ,6.2.4 හා 6.2.5 පරිදි සේවා කාලයන් සම්පූර්ණ කර ඇති සේවකයන් අනිවාර්යයෙන්ම ස්ථාන මාරුවීම් වලට යටත්වේ.

6.2 (ඇ) අති දුෂ්කර/දුෂ්කර සේවා ස්ථානයක සේවය කිරීමෙන් පසු ඉතා ප්‍රියමනාප හෝ ප්‍රියමනාප පාසලකට ස්ථාන මාරු විය හැකිය. එහි වසර 06 ක කාලයක් සේවය කිරීමෙන් පසුව ද යළි දුෂ්කර පාසලක අවුරුදු 03 ක් හෝ අපහසු නොවන පාසලක අවුරුදු 04 ක කාලයක් සේවය කිරීම සඳහා යෙදවිය හැක.

6.3 **සේවා ස්ථාන වර්ගීකරණය**

රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2005/01 චක්‍රලේඛය අනුව සහ එයට අදාළ වන සංශෝධන ඇතුළත්ව සියලුම පාසල් පහත පරිදි වර්ග කරනු ලැබේ.

6.3.1 අතිදුෂ්කර
6.3.2 දුෂ්කර
6.3.3 අපහසු නොවන
6.3.4 ප්‍රියමනාප/පහසු
6.3.5 ඉතා ප්‍රියමනාප/වඩාත් පහසු

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024 - 07 - 25 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම් (වැ. ආ.)

ප්‍රියමනාප/ඉතා ප්‍රියමනාප පාසල්වල සේවය කරන සේවකයන් විසින් නැවත ප්‍රියමනාප ස්ථානයකට කරනු ලබන ඉල්ලීම් සලකා බලනු ලබන්නේ එම සේවා ස්ථානවලට අතිදුෂ්කර, දුෂ්කර හා අපහසු නොවන සේවා ස්ථානවල සේවය කරන සේවකයන් විසින් කරනු ලබන ඉල්ලීම් සලකා බැලීමෙන් පසුවය.

6.4 ස්ථාන මාරු කරන ආකාරය

6.4.1 වාර්ෂික ස්ථාන මාරු

ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන සේවකයන්ගේ ඉල්ලීම් ඉටු කිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල ක්‍රියාත්මක කෙරේ.

6.4.2 වාර්ෂික නොවන ස්ථාන මාරු

පහත දැක්වෙන හේතු මත සිදු කරනු ලබන ස්ථාන මාරු වාර්ෂික ස්ථානමාරු වශයෙන් නොසැලකේ

6.4.2.1. සේවා අවශ්‍යතාවය මත
6.4.2.2. අන්‍යෝන්‍ය ස්ථාන මාරු මත
6.4.2.3. පත්කල රජයේ වෛද්‍ය මණ්ඩලයක නිර්දේශ මත
6.4.2.4. සේවා ස්ථානයේ වෙනසක් නොවන මාරු කිරීම
6.4.2.5. විනය හේතූන් මත

6.5 ක්‍රමවේදය සහ අනෙකුත් කරුණු

I. වාර්ෂික ස්ථාන මාරු පරිපාටියෙහි 6.2 (ආ) ඡේදය යටතට ගැනෙන සියළුම සේවකයින් වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

II. වාර්ෂික ස්ථාන මාරු පරිපාටියෙහි 6.2 (අ) ඡේදය යටතට ගැනෙන සේවකයෙකු වෙනත් පාසලකට ස්ථාන මාරු වීමට ඉල්ලා ඇති විටක, එම ඉල්ලීම ඉටු කිරීම සඳහා සේවකයා ස්ථාන මාරු වීමට ඉල්ලා ඇති පාසලේ සේවය කරනු ලබන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 6.2 (ආ) ඡේදයේ සඳහන් පරිදි ස්ථාන මාරු වීමට යටත්වන හා අදාළ පාසලේ වැඩිම සේවා කාලයක් සහිත සේවකයන් ඉන් පිටතට මාරු කරනු ලැබේ.

III. යම් පාසලකට ස්ථාන මාරු වීමට වැඩි ඉල්ලීම් ප්‍රමාණයක් ඇති විට, එම ඉල්ලීම් අතුරින් 6.2 (අ) යටතේ වැඩි සේවා කාලයක් සපුරා ඇති සේවකයන් (අනිකුත් කොන්දේසි වලට යටත්ව) එම පාසලට ස්ථාන මාරු කරනු ලැබේ.

IV. ප්‍රියමනාප/ ඉතා ප්‍රියමනාප පාසල් වලට ස්ථාන මාරුවීම් ලබා දීමේ දී වඩාත් ප්‍රමුඛතාවය දක්වන්නේ අති දුෂ්කර/ දුෂ්කර පාසල්වල සේවය කළ සේවකයින්ටය. මෙවැනි ස්ථාන මාරුවීම් වල දී සේවා කාලය හා සේවකයන් ඉදිරිපත් කර ඇති ප්‍රායෝගික ගැටළු තත්ත්වයන් ද සළකා බලනු ලැබේ.

V. ස්ථාන මාරු කමිටුව විසින් සේවකයන් මාරු කිරීමේ දී පාසල් වල සේවා අවශ්‍යතාවයන් ද පාසලේ ශිල්පීය නොවන කාර්ය මණ්ඩල කණිෂ්ඨ/ජ්‍යෙෂ්ඨතාවයේ සමබරතාවය රැකීමට සෑමවිටම උත්සහ කළ යුතුය.

VI. ස්ථාන මාරුවීමට කාලය සපුරා ඇති සේවකයන් සම්බන්ධයෙන් ආයතන ප්‍රධානියා විසින් නිසි වැඩපිළිවෙලක් සකස් කර ස්ථාන මාරු ලබා දීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දිය යුතුය.

(උදා - ස්ථාන මාරු ලබා දීමට සිටින සේවකයාගේ පාසලේ රාජකාරී කල්වේලා ඇතිව වෙනත් සේවකයෙකුට පුහුණු කිරීම.)

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024-07-25 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම් (ස.ආ.)

6.6 සේවා කාලය ගණනය කිරීම.

I. වාර්ෂික ස්ථාන මාරු වීම් සඳහා සුදුසුකම් ලබන සේවා කාලය ගණනය කරනු ලබන්නේ වර්ෂයේ දෙසැම්බර් 31 දිනටය.
(උදා: 2025 වර්ෂයේ ස්ථානමාරුවීම් සඳහා කාලය ගණනය කරනු ලබන්නේ 2024.12.31 දිනටය.)

II. සේවා කාලය ගණනය කිරීමේ දී සේවය ආරම්භක දිනය ලෙස සැළකිය යුත්තේ සේවයට වාර්තා කළ වර්ෂයේ ජනවාරි මස 01 වන දිනයයි. නමුත් සේවකයාගේ පාලන විෂය ඉක්මවා ගිය කරුණක් හේතුවෙන් සේවයට වාර්තා කළ දිනය පසු දිනයක් වේ නම්, ස්ථාන මාරු කමිටුව ඒ පිළිබඳව සැළකිල්ල යොමු කරයි. (තවද, සේවකයාගේ පාලන විෂය ඉක්මවා ගිය හේතුවක් මත සේවයේ නොසිටි කාලය ස්ථාන මාරු සේවා කාලය සඳහා ගණන් ගනු නොලැබේ.)

III. පාසලක් ස්ථාපිතවීම හෝ අහෝසිවීම හේතුවෙන් එක් පාසලක සිට වෙනත් පාසලකට අනුයුක්ත කිරීමට සිදු වූ සේවකයන් සම්බන්ධයෙන් සේවා කාලය ගණනය කිරීමේ දී අහෝසි කරන ලද පාසලේ සේවා කාලය ද අයදුම්පත් ඉදිරිපත් කිරීමට අවශ්‍ය අවම සේවා කාලය සඳහා ගණන් ගනු ලැබේ.

07. විශේෂිත කරුණු

7.1 ප්‍රමුඛතාවය ලබාදීම

- යම් සේවකයෙකුගේ කලත්‍රයා පොලිසියේ හෝ ත්‍රිවිධ හමුදාවේ ක්‍රියාන්විත රාජකාරියේදී ආබාධිත තත්වයට පත්ව ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන විට සේවකයන්ගේ ස්ථාන මාරුවීම් කලයුතු වන්නේ ඔවුන්ගේ ඉල්ලීම පරිදි පමණි. එසේම එවැනි සේවකයින්ගේ ප්‍රියමනාප සේවා ස්ථානයකින් ඊට ආසන්නම පාසලකට හෝ සේවකයාගේ ඉල්ලීමකට අදාල පාසලකට මාරු කල යුතුය.

- සෑම විටම සේවකයාගේ ඉල්ලීම අනුව තම කලත්‍රයාගේ සේවා ස්ථානය අයත් ප්‍රදේශයට ආසන්න සේවා ස්ථානයකට ස්ථාන මාරුවීම් ලබාදිය හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතු අතර දුෂ්කර/ අති දුෂ්කර සේවා ස්ථානයන්හි සේවය සඳහා සේවකයින් තෝරා ගැනීමේදී පාසල් යන දරුවන් ඇති විවාහක සේවකයින්ට වඩා අවිවාහක සේවකයින්ද පාසල් යන දරුවන් නොමැති විවාහක සේවකයින්ද හැකි සෑම අවස්ථාවකදීම තෝරා ගැනීමට ප්‍රමුඛතාවය ලබාදිය යුතුය.

- ළදරුවන්, පාසල් යන දරුවන්, ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයන් සහ කලත්‍රයා විදේශ ගතව සිටින අවස්ථාවන්හිදී, පිළිගත හැකි කරුණු සහිතව විදුහල්පතිගේ සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශයන්ද සහිත්ව ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳව සැලකිල්ලට ගෙන කටයුතු කළ යුතුය.

- ආබාධිත කොන්දේසි යටතේ බඳවාගත් සේවකයින් ඔවුන්ගේ ඉල්ලීමක් නොමැති කල්හි ස්ථානමාරුවීම් කරනු නොලැබේ.

7.2 වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත් නොවන සේවකයන්

- අවුරුදු 55 ඉක්මවූ සේවකයින් කලාපය තුල වෙනත් පාසලකට මාරුකල හැකි වුවද සේවකයින්ගේ ඉල්ලීමක් නොමැතිව කලාපයෙන් පිටතට මාරු නොකල යුතුය.

- වාර්ෂික ස්ථානමාරු නියෝග ක්‍රියාත්මක වන දිනට අවුරුදු 58 ඉක්මවූ සේවකයින් ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි කලාපය තුල වුවද ස්ථානමාරු නොකල යුතුය. ප්‍රියමනාප සේවා ස්ථානයන්හි වාර්ෂික ස්ථානමාරු නියෝග ක්‍රියාත්මක වන දිනට අවුරුදු 59 ඉක්මවූ සේවකයින්ද ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි ස්ථානමාරු නොකල යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024-07-25 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම් (ස.ආ.)

7.3 වෘත්තීය සංගම් සඳහා අනුග්‍රහය

- කම්කරු කොමසාරිස් ජනරාල් විසින් ලියාපදිංචි කරනු ලැබූ (මධ්‍යම පළාත තුල ලියාපදිංචි හා අනුමත) ඉහත සඳහන් සේවයට අයත් සේවකයින්ගේ නියෝජනයන් සහිත, සංගමයක/වෘත්තීය සමිතියක සභාපති/ ලේකම්/ භාණ්ඩාගාරික හා මධ්‍යම විධායක මණ්ඩලයේ සභිකයින් මාරු කරන්නේ නම් අදාළ වෘත්තීය සංගමයේ ලේකම්ගේ නිර්දේශය සැලකිල්ලට ගෙන සංගමයේ කටයුතුවලට බාධා නොවන සේවා ස්ථානයකට මාරු කළ යුතුය.

- මෙම වගන්තියේ දැක්වෙන අනුග්‍රහ භුක්ති විදීමට අපේක්ෂා කරන ප්‍රස්තුත සේවයේ වෘත්තීය සංගම් වල නිලධාරීන් සංගමයේ ලේකම් මගින් ඒ සඳහා ඉල්ලුම් පත්‍රයක් පිළියෙල කර (ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7.5 උප වගන්තිය අනුව) ස්ථානමාරු කමිටු රැස්වීමට සති දෙකකටවත් පෙර මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කල යුතුය. එසේ ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7.2 උප වගන්තිය අනුව අනුග්‍රහ ලබාදිය යුතු වන්නේ කවර නිලතල වලටද යන වගත්, කුමන සංගමයකටද යන වගත්, අනුයුක්ත කල යුතු වන්නේ කවර ස්ථාන වලටද යන වගත්, මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තීරණය කරනු ලැබේ. මේ පිළිබඳව පසුව ඉදිරිපත් කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ. ඉතා ප්‍රියමනාප/ප්‍රියමනාප පාසල්/ආයතන වල රැදී සිටීමට මෙම අනුග්‍රහය අදාල කර ගත නොහැක.

## 08. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය

8.1 වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ කාර්යභාරය

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිහි XVIII පරිච්ඡේදයේ විධිවිධානවලට සහ මෙම ස්ථාන මාරු පටිපාටියේ දැක්වෙන කරුණුවලට යටත්ව, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති 253 හි I හා II වගන්තිවලට අනුව ඉහත 6.4 (අ) ඡේදයේ සඳහන් අවස්ථාවල දී අමාත්‍යාංශ ලේකම්ට නිර්දේශ ලබාදීම මාරු කමිටුවල කාර්යභාරය වේ.

8.2 වාර්ෂික ස්ථාන මාරු කමිටුවෙහි සංයුතිය පිළිබඳ විස්තරය

වාර්ෂික ස්ථානමාරු යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ඉහත 6.1 හි සඳහන් සේවකයින් සඳහා වාර්ෂික ස්ථාන මාරු කමිටු පිහිටුවීමට මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් කටයුතු කරනු ලැබේ. එම වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය පහත දැක්වේ.

a. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු
b. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කරනු ලබන ආයතනික කටයුතු වල නිරත මාණ්ඩලික නිලධරයකු
c. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින වෙනත් දෙපාර්තමේන්තුවක ආයතනික කටයුතු වල නිරත මාණ්ඩලික නිලධරයකු
d. මධ්‍යම පළාත තුළ ප්‍රාථමික ශිල්පීය නොවන සේවයට අයත් සේවකයින්ගෙන් 15% කට වඩා වැඩි සංඛ්‍යාවක් සාමාජිකත්වය දරන ලියාපදිංචි හා අනුමත වෘත්තීය සංගම්වල නියෝජිතයන් එක් අයෙකු බැගින්

## 09. වාර්ෂික ස්ථාන මාරු අභියාචනා සමාලෝචන කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තරය

වාර්ෂික ස්ථාන මාරු අභියාචනා ඉදිරිපත් කිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් අතෘප්තිමත් වන සේවකයින් සඳහා වාර්ෂික ස්ථාන මාරු අභියාචනා සමාලෝචන කමිටු පිහිටුවීමට මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාශයේ ලේකම් විසින් කටයුතු කරනු ලැබේ. එම වාර්ෂික ස්ථාන මාරු අභියාචනා සමාලෝචන කමිටුවේ සංයුතිය පහත දැක්වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024-07-25 දින
අනුමත කරනු ලදී.
[signature]
ආණ්ඩුකාර ලේකම් (මා. ආ.)

a. අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
b. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නම් කරනු ලබන මාණ්ඩලික නිලධාරියෙකු
c. වාර්ෂික ස්ථානමාරු කමිටුවට අයත්වූ නිලධරයකු

10. වාර්ෂික ස්ථාන මාරු කාල සටහන

| අනු අංකය | කාරණය | කාල සීමාව |
|---|---|---|
| 10.1 | ස්ථාන මාරු කමිටු පිහිටුවීම | ජූනි 01 දිනට පෙර |
| 10.2 | දැන්වීම් සඳහා කාලසීමාව | ජූලි 01 දිනට පෙර |
| 10.3 | ස්ථාන මාරුවීම් ඉල්ලීම් කලාප කාර්යාලවලට ලබා ගැනීම | ජූලි 31 දිනට පෙර |
| 10.4 | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා තොරතුරු සැපයීම | අගෝස්තු 10 දිනට පෙර |
| 10.5 | ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම | සැප්තැම්බර් 15 දිනට පෙර |
| 10.6 | ස්ථාන මාරුවට එරෙහිව අභියාචනා ඉදිරිපත් කිරීම | සැප්තැම්බර් 30 දිනට පෙර |
| 10.7 | සමාලෝචන කමිටුව මඟින් ලබා දෙනු ලබන අභියාචනා තීරණ මත අවසාන ස්ථාන මාරුවීම් නියෝග නිකුත් කිරීම | නොවැම්බර් 01 දිනට පෙර |
| 10.8 | ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම | ජනවාරි 01 දින සිට |

** මෙම කාල සටහනෙහි ඇතුලත් දින වකවානු සුදුසු පරිදි වෙනස් කිරීමේ බලය අමාත්‍යාංශ ලේකම් සතු වන්නේය.

11. **වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම පිළිබඳ විස්තර**

1.11 වාර්ෂික ස්ථානමාරු සම්බන්ධයෙන් අතෘප්තිමත් වන සේවකයන් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සැප්තැම්බර් 30 දිනට පෙර 2 වන පරිශිෂ්ඨයේ සඳහන් අයදුම්පත මගින් තම අභියාචනා ඉදිරිපත් කල යුතු වන අතර, අභියාචනයේ සඳහන් කරුණු තහවුරු කිරීමට අදාල ලියකියවිලි වල සහතික කල පිටපත්ද ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සමග ඉදිරිපත් කල යුතුය. සැප්තැම්බර් 30 දිනෙන් පසු එවන අභියාචනා පිළිබඳව සලකා බලනු නොලැබේ.

12. **සේවකයින්ගේ වගකීම.**

වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියලුම සේවකයන් නියමිත දිනයේදී නව රාජකාරි ස්ථානය වෙත සේවය සඳහා වාර්තා කිරීමට බැඳී සිටී.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024-07-25 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම් (පා. අා.)

13. පද සම්බන්ධයෙන් වන පැහැදිලි කිරීම.

13.1 **"ගරු ආණ්ඩුකාරතුමා"** යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමා/තුමිය වේ.

13.2 **"අමාත්‍යාංශ ලේකම්"** යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයා වේ.

13.3 **"දෙපාර්තමේන්තු ප්‍රධානියා/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ"** යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වේ.

13.4 **"වෘත්තීය සංගම්"** යනුවෙන් අදහස් කරනුයේ කම්කරු කොමසාරිස් ජනරාල් විසින් ලියාපදිංචි කරනු ලැබූ මධ්‍යම පළාත් ප්‍රාථමික ශිල්පීය නොවන සේවයට අයත් සේවකයින්ගෙන් 15% කට වඩා වැඩි සංඛ්‍යාවක් සාමාජිකත්වය දරන මධ්‍යම පළාත තුල ලියාපදිංචි හා අනුමත වෘත්තීය සංගම් වේ.

13.5 **"නියමිත දිනය"** යනුවෙන් අදහස් කරනුයේ වාර්ෂික ස්ථාන මාරු වීම් ක්‍රියාත්මක වන දිනය අදහස් වේ.

13.6 **"ආයතන ප්‍රධානියා"** යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් අධ්‍යාපන කලාපයක කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා සහ මධ්‍යම පළාතේ පළාත් පාසලක විදුහල්පතිවරයාවේ.

13.7 **"අභිනියෝජිත බලධරයා"** යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයා වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024-07-25 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

පළමු පරිශිෂ්ටය

## මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවය සඳහා වන වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍රය

1. දැනට සේවය කරන ආයතනය/පාසල :-..........................................................................
   1.1. එම ආයතනය/පාසල අයත් දිස්ත්‍රික්කය :-..........................................................
   1.2. අදාළ ආයතනයට/පාසලට පත් කළ දිනය :- ............................................................
2. සේවකයාගේ සම්පූර්ණ නම :- ...............................................................................
   2.1. ජාතික හැඳුනුම්පත් අංකය :- ........................................................................
3. ස්ථිර පෞද්ගලික ලිපිනය :-.....................................................................................
   .....................................................................................
   3.1. දැනට පදිංචි ස්ථානයේ ලිපිනය :- ..................................................................
   .....................................................................................
   3.2. දූරකථන අංකය :- ..................................................................................
4. උපන් දිනය :- ...................... වයස:- අවු මාස දින
   4.1. 4.1. ස්ත්‍රී / පුරුෂ භාවය :- ............................
5. සේවකයා විවාහකද අවිවාහක ද යන බව :-............................
   5.1 දරුවන් පිළිබඳ තොරතුරු (අදාළ වේ නම්)

| දරුවන්ගේ නම් | වයස | ඉගෙනුම ලබන පාසල |
|---|---|---|
| | | |
| | | |
| | | |

   5.2 කලත්‍රයාගේ නම :- ..........................................................................
      5.2.1. කලත්‍රයාගේ සේවා ස්ථානය :- ..........................................................
      5.2.2. කලත්‍රයා ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිසියේ සේවයේ ක්‍රියාන්විත සේවයේ නියුතුද:-......
      5.2.3. එසේනම් ඔහු/ඇය අයත් වන සේවාව හා තනතුර :- ..................................
   5.3 සේවකයා දැනට දරණ තනතුර :-..............................................................
      5.3.1. දැනට සිටින පන්තිය හෝ ශ්‍රේණිය:- ..................................................
      5.3.2. එම පන්තියට ශ්‍රේණියට පත් වූ දිනය :- ..............................................
      5.3.3. මුල් පත්වීම් දිනය:- ..................................................

6. සේවයට ඇතුළත් වූ දින සිට මේ දක්වා එක් එක් කලාප අධ්‍යාපන කාර්යාල/පළාත් පාසල් වල සේවය කර ඇති සේවා විස්තරය (අසම්පූර්ණ හා සාවද්‍ය තොරතුරු සැපයීම නොකළ යුතුය.)

| කලාප අධ්‍යාපන කාර්යාලය/ පළාත් පාසල | වර්ගීකරණය අනුව සේවා ස්ථානයේ වර්ගය (අති දුෂ්කර/ දුෂ්කර/ අපහසු නොවන/ ප්‍රියමනාප/ ඉතා ප්‍රියමනාප) | කාලසීමාව | | මුළු සේවා කාලය |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| | | | | |
| | | | | |
| | | | | |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024-07-25 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම් (වා.ආ.)

| | | | | |
|---|---|---|---|---|
| | | | | |

7. කාර්යසාධන ඉලක්ක සපුරා ගැනීම පිළිබඳ විස්තර (සනාථ කිරීම සඳහා ලිඛිත තොරතුරු සපයා තිබීම අත්‍යවශ්‍යයි.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................

8.ස්ථාන මාරුව ඉල්ලා සිටින කලාප අධ්‍යාපන කාර්යාලය/පළාත් පාසල:-

8.1 ..........................................................................................................

8.2. ..........................................................................................................

8.3. ..........................................................................................................

9. ස්ථාන මාරු ඉල්ලීමට හේතු:-

9.1 ..........................................................................................................

9.2 ..........................................................................................................

9.3 ..........................................................................................................

10. විශේෂයෙන් සඳහන් කිරීමට හේතු ඇත්නම් :-

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය බව මම ප්‍රකාශ කරමි. මා විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා හට විරුද්ධව විනයානුකූලව කටයුතු කළ හැකි බව මම දනිමි.

දිනය:- ....................................  ....................................

සේවකයාගේ අත්සන

II කොටස

විදුහල්පතිගේ නිර්දේශය

සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව / රහිතව සේවකයා මුදා හැරිය හැකිය

දිනය ....................................  අත්සන ....................................

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය

සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව / රහිතව සේවකයා මුදා හැරිය හැකිය

දිනය ....................................  අත්සන ....................................

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024-07-25 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම් (ස.ආ.)

දෙවැනි පරිශිෂ්ටය

මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවය සඳහා වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන අභියාචනය

1. සේවකයා පිළිබඳ විස්තර
 1.1 සම්පූර්ණ නම :-................................................................................................
 1.2.අයත්වන ශ්‍රේණිය :- ...............................................................................................
 1.3. සේවා ස්ථානය :- ...............................................................................................

2. අභියාචනයට පදනම් ව ඇති තීරණය / නියෝගය පිළිබඳ විස්තර:-
 2.1. තීරණය / නියෝගය කුමක්ද යන වග සැකෙවින්
 ...............................................................................................................................
 2.2. තීරණ/නියෝගය දෙන ලද්දේ කා විසින්ද ? ..........................................................
 2.3. තීරණය /නියෝගය සේවකයාට ලැබුණු දිනය:- ..................................................
 2.4. තීරණය /නියෝගය දැක්වෙන ලිපියේ සහතික කළ පිටපත් පහතින් දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.
 ඇමුණුම 1. ..........................................................................................................
 ඇමුණුම 2. ..........................................................................................................

3. තීරණයට / නියෝගයට එරෙහිව අභියාචනයක් ඉදිරරිපත් කිරීමට හේතු:-
 3.1 ..........................................................................................................................
 3.2 ..........................................................................................................................
 3.3 ..........................................................................................................................
 3.4 ..........................................................................................................................
 3.5 ..........................................................................................................................
 3.6. මෙම හේතු සනාථ කිරීමට අදාළ ලිඛිත සාධක වල සහතික කළ පිටපත් පහත දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත
 ...............................................................................................................................
 ...............................................................................................................................
 ..........................................................................................

4.2. ඉල්ලා සිටිනු ලබන සහන:-
 ...............................................................................................................................
 ...............................................................................................................................
 ...............................................................................................................................
 .......................................................................

දිනය:- ............................................. .................................................
 සේවකයාගේ අත්සන

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024 - 07 - 25 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම් (ර්ා.අා)

නෙවන පරිශිෂ්ටය

ප්‍රාථමික ශිල්පීය නොවන සේවයේ වාර්ෂික ස්ථානමාරු වලට යටත් සේවකයන්ගේ විස්තර මෙහි අනිවාර්යයෙන් ඇතුළත් විය යුතු බව සලකන්න.

| සේවකයාගේ නම: මයා/මිය/මෙය | ජාතික හැ. අංකය | තනතුර හා ශ්‍රේණිය | උපන් දිනය හා ......... දිනට වයස | වර්තමාන සේවා ස්ථාන හා එහි සේවා කාලය | විවාහක/ අවිවාහක බව | කලත්‍රයාගේ සේවා ස්ථානය | දරුවන් සංඛ්‍යාව හා පාසල් යන දරුවන් සංඛ්‍යාව | ස්ථිර පදිංචි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය හා පදිංචි ලිපිනය | මුල් පත්වීමේ දින සිට සේවා ස්ථාන හා සේවය කල කාල සීමාවන් | වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් කර නොමැති වුවත් ස්ථාන මාරුවක් ලැබුන හොත් සේවය කිරිමට කැමති ආයතන 03ක් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

සකස් කලේ:- අත්සන :

නම :

දිනය :

පරික්ෂා කලේ :- අත්සන :

නම :

දිනය :

මෙම කලාපයේ වාර්ෂික ස්ථාන මාරුවීම් වලට යටත් සේවා කාලය සම්පූර්ණ කර ඇති මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවයේ සේවකයන් පිළිබඳ සියළුම විස්තර ලේඛනයට ඇතුළත් කර ඇති බවත් , සියළුම තොරතුරු නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

.............................................................

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ අත්සන
( නිලමුද්‍රාව )

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024.07.25 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම් (ස.ආ.)

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :- නිර්දේශ කරමු

1. මහාචාර්ය එච්.එම්.ඩී.ආර්. හේරත් මහතා {සභාපති (රා.ආ.)} ..............................
2. ඩබ්ලිව්.එම්.එස්.ඩී.වීරකෝන් මහතා (සාමාජික) ..............................
3. ඒ.එම්.ආර්.බී. තෙන්නකෝන් මහතා (සාමාජික) ..............................
4. ජේ.ඩී.කේ.වික්‍රමරත්න මහතා (සාමාජික) ..............................
5. පී.ටී.ජී. ගුණතිලක මහතා (සාමාජික) ..............................
6. සී.පී.එස්.ඉලංගසිංහ මහතා (සාමාජික) ..............................

දිනය : 2024. 07. 16

ආණ්ඩුකාර ලේකම් ,

2024. 07. 16 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 2024 / 1597 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද "මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවයේ තනතුරු සඳහා වන ස්ථාන මාරු පටිපාටිය " ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය : 2024/07/19

..............................
ලේකම් ,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

නිල මුද්‍රාව.

කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය :- අනුමත කරමි. / නොකරමි.

2024-07-25

[illegible] ලලිත් යූ. ගමගේ
ආණ්ඩුකාරවර
මධ්‍යම පළාත